(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 21. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 පෙබරවාරි 18 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(මහාචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **එම්. කේ. එම්. අස්ලම් මහතා**

ගරු **හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**

ගරු **බී. ආරියවංශ මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **අර්කම් ඉල්යාස් මහතා**

ගරු **එම්. එස්. උදුමාලෙබ්බේ මහතා**

ගරු **ඔෂානි උමංගා මහත්මිය**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

ගරු **නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**

ගරු **කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු කෝසල නුවන් ජයවීර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු අමිල ප්‍රසාද් මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්. ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු දිනිඳු සමන් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, ම'විසින් 2025 පෙබරවාරි 17 දින 'පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන)' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති, ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2021 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) අක්මීමණ, කපුහෙම්පල, අම්බලම කන්ද යන ලිපිනයෙහි පදිංචි ඒ. කේ. විජේපාල මහතාගෙන් ලැබුණු 2024.12.05 දිනැති පෙත්සම;

(ii) ගාල්ල, වලහන්දූව, යග්ගහ, අංක 159/1 දරන ස්ථානයෙහි පදිංචි සී. එම්. වෙත්තසිංහ මහත්මියගෙන් ලැබුණු 2024.12.16 දිනැති පෙත්සම;

(iii) ගාල්ල, ගොනාමුල්ල හංදිය යන ලිපිනයෙහි පදිංචි ඩී. ජී. සුමනසේකර මහතාගෙන් ලැබුණු 2024.11.30 දිනැති පෙත්සම;

(iv) ඉමදූව, දිගොඩ, සපුගහවත්ත, අංක 71 දරන ස්ථානයෙහි පදිංචි ජී. ඩී. නන්දන මහතාගෙන් ලැබුණු 2024.12.10 දිනැති පෙත්සම;

(v) හියාරේ, බස්නියමලදෙණිය යන ලිපිනයෙහි පදිංචි ජී. ආර්. එන්. බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2024.12.10 දිනැති පෙත්සම;

(vi) නුවරඑළිය, ග්ලේන් ෆෝල් පාර, අංක 33/11 ඒ දරන ස්ථානයෙහි පදිංචි ගාල්ලගේ ජිනප්‍රිය මහතාගෙන් ලැබුණු 2024.11.23 දිනැති පෙත්සම;

(vii) හබරාදූව, කටුකුරුන්ද, ගල්ගෙවත්ත යන ලිපිනයෙහි පදිංචි එල්. පී. වික්‍රමසිංහ මහත්මියගෙන් ලැබුණු 2024.12.17 දිනැති පෙත්සම;

(viii) අහංගම, මැලියගොඩ, බෝගහවත්ත යන ලිපිනයෙහි පදිංචි එල්. පී. ආර්. සජීවනී මහත්මියගෙන් ලැබුණු 2025.01.20 දිනැති පෙත්සම;

(ix) උණවටුන, මැටරඹ, ගල්ලැන්ද වත්ත යන ලිපිනයෙහි පදිංචි එම්. එච්. රංජිත් අමරසේන මහතාගෙන් ලැබුණු 2024.12.14 දිනැති පෙත්සම;

(x) ඉමදූව, මායකඩුව, කහකඩේ යන ලිපිනයෙහි පදිංචි එම්. කේ. ආරියරත්න මහතාගෙන් ලැබුණු 2024.12.29 දිනැති පෙත්සම;

(xi) ඉමදූව, කෝදාගොඩ, හික්ගහහේන යන ලිපිනයෙහි පදිංචි ප්‍රේමරත්න හෙට්ටිආරච්චි මහතාගෙන් ලැබුණු 2024.12.29 දිනැති පෙත්සම; සහ

(xii) කලුතර, කටුකුරුන්ද, ධම්මාරාම මාවත, අංක 15 දරන ස්ථානයෙහි පදිංචි රසිකා විහෝධිනී රයිගම් බණ්ඩාර මහත්මියගෙන් ලැබුණු 2025.01.04 දිනැති පෙත්සම

ගරු රත්න ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කහටෝවිට, ඕගොඩපොළ, අංක 127/2 දරන ස්ථානයෙහි පදිංචි එස්. ඒ. එම්. නිලාම් මහතාගෙන් ලැබුණු 2024.12.04 දිනැති පෙත්සම ගරු මුනීර් මුලාෆර් මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) තංගල්ල, කදුරුපොකුණ පාර, ලැබීම අංක 147/4 දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. එස්. උදේශානි මහත්මියගෙන් ලැබුණු 2024.12.01 දිනැති පෙත්සම;

(ii) බෙලිඅත්ත, වටරක්ගොඩ යන ලිපිනයෙහි පදිංචි කංකානම් පතිරණගේ රංජිත් මහතාගෙන් ලැබුණු 2024.12.09 දිනැති පෙත්සම;

(iii) තංගල්ල, කදුරුපොකුණ, සියඹලාගහහේන යන ලිපිනයෙහි පදිංචි එම්. කේ. බුද්ධදාස ජයසේකර මහතාගෙන් ලැබුණු 2024.12.01 දිනැති පෙත්සම;

(iv) තංගල්ල, කදුරුපොකුණ පාර යන ලිපිනයෙහි පදිංචි එම්. පී. බර්ටි මහතාගෙන් ලැබුණු 2024.12.10 දිනැති පෙත්සම;

(v) අම්බලන්තොට, කිවුල-ලූණම, ග්‍රාමෝදය මාවත, අංක 379 දරන ස්ථානයෙහි පදිංචි නන්දනී එදිරිසූරිය මහත්මියගෙන් ලැබුණු 2025.01.03 දිනැති පෙත්සම;

(vi) දික්වැල්ල, පොල්ගහමුල්ල යන ලිපිනයෙහි පදිංචි පී. ඒ. කරුණාසේන මහතාගෙන් ලැබුණු 2024.11.23 දිනැති පෙත්සම;

(vii) බරවකුඹුක, සියඹලා කොටේ, කොඩිතුවක්කු කඩේ යන ලිපිනයෙහි පදිංචි ආර්. කේ. කේ. ඒ. නන්දසිරි මහතාගෙන් ලැබුණු 2025.01.05 දිනැති පෙත්සම;

(viii) මාතර, කෝට්ටගොඩ, පාතේගම උතුර, බෝගහවත්ත යන ලිපිනයෙහි පදිංචි එස්. එස්. මහින්ද අබේසේකර මහතාගෙන් ලැබුණු 2024.12.13 දිනැති පෙත්සම;

(ix) ජුලම්පිටිය, ගල්පොත්තයාය, අංක 78 දරන ස්ථානයෙහි පදිංචි යූ. ආර්. ගාම්භීර ආරච්චි මහතාගෙන් ලැබුණු 2024.12.13 දිනැති පෙත්සම;

(x) නාකුළුගමුව, ගලගම, 'සිරි සෙවන' යන ලිපිනයෙහි පදිංචි යූ. ඩබ්ලිව්. ඒ. පියසිරි මහතාගෙන් ලැබුණු 2024.11.28 දිනැති පෙත්සම;

(xi) අම්බලන්තොට, දෙහිගහලන්ද, රෝහණ වත්ත, අංක 265/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජී. පී. ඇපා මහතාගෙන් ලැබුණු 2024.11.19 දිනැති පෙත්සම; සහ

(xii) හකුරුවෙල, මැදයාල, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. කේ. ජී. නිරෝෂා මහත්මියගෙන් ලැබුණු 2024.12.10 දිනැති පෙත්සම

ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(4) මොනරාගල, මාරාව, හුළංදාව වම, 02 කණුව දරන ස්ථානයෙහි පදිංචි එච්. පී. වී. ක්වින්ටස් ජෝර්ජ් මහතාගෙන් ලැබුණු 2024.12.23 දිනැති පෙත්සම ගරු අජිත් අගලකඩ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) රදාවෙල, පල්ලාවෙල, 'නිසල්' යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ඩබ්ලිව්. තමරසිරි මහතාගෙන් ලැබුණු 2025.01.16 දිනැති පෙත්සම ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) දිගන, දිගන නිලගම, අංක 935/10 දරන ස්ථානයෙහි පදිංචි ඩී. ජයණී නිමන්තිකා මහත්මියගෙන් ලැබුණු 2024.12.08 දිනැති පෙත්සම;

(ii) තලාතුඔය, මුදුනකඩේ, දේවාල පාර, අංක 68/2 දරන ස්ථානයෙහි පදිංචි කේ. පී. ඩබ්ලිව්. ජී. ඥානලතා මහත්මියගෙන් ලැබුණු 2025.01.07 දිනැති පෙත්සම; සහ

(iii) තලාතුඔය, කෙලින් වීදිය, අංක 84 දරන ස්ථානයෙහි පදිංචි එස්. එල්. හෙට්ටිආරච්චි මහත්මියගෙන් ලැබුණු 2024.12.26 දිනැති පෙත්සම

ගරු ජගත් මනුවර්ණ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. විසර්ජන පනත් කෙටුම්පත — (පළමුවැනි වෙන් කළ දිනය):** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2025 පෙබරවාරි 17),—

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යි ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

(පූ.භා. 11.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(පූ.භා. 11.24 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය යුතු ය"යි අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.41 ට ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.)

"ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.13 ට ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.)

“ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.16 ට ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 6.00 වූයෙන් විවාදය කල් ගියේය; එතැන් සිට විවාදය 2025 පෙබරවාරි 19 බදාදා පවත්වනු ලැබේ.

**6. කල් තැබීම (දෙහිවල, මීලාද් විද්‍යාලය සඳහා අමතර ගොඩනැඟිල්ලක් ලබා දීම.):** “මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය”යි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 6.26 ට, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් පාර්ලිමේන්තුව 2025 පෙබරවාරි 06 සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 19 බදාදා පූ.භා. 9.30 වනතෙක් කල් තබන ලදී.